# සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන සඳහා අභ්‍යාසලාභීන් බඳවාගැනීම සඳහා වූ චක්‍රලේඛය

# 2021

චක්‍රලේඛ අංක: SSD/06/2020

මගේ අංකය: SSD/04/02/01/01
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
02 වන මහල,
සෙත්සිරිපාය, II අදියර
බත්තරමුල්ල.

2020.09.14

ප්‍රාදේශීය ලේකම් මගින්,
සමාජ සේවා නිලධාරී,
සංවර්ධන නිලධාරී ( සමාජ සේවා )
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
.................................

**සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම**

**(2021 ජනවාරි ආරම්භ කිරීමට නියමිත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම)**

ආබාධ සහිත පුද්ගලයින් තම නිවසට,ප්‍රජාවට බරක් නොවී වැඩදායක පුරවැසියන් සේ සමාජයේ ජීවත් වීමට අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කරනු වස් වෘත්තීය පුහුණුව ලබාදීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ කාර්යභාරයක් වේ. මෙම වෘත්තීය පුහුණුව තුළින් ස්වයං රැකියාවක නිරත වෙමින් ආදායමක් උපයා ගැනීම සේම රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ව්‍යවසායකයකු යටතේ රැකියාවක නිරත වීමටද ඉවහල් වනු ඇත.

මේ වන විට දිවයින පුරා පිහිටා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් වාර්ෂිකව 500 ක පමණ පිරිසක් පුහුණුව අවසන් කර පිටවෙන අතර ඉන් පිටව ගිය පිරිස් විවිධ වෘත්තීන්වල නියලෙමින් ස්වෝත්සාහයෙන් ජීවත්වෙමින් ව්‍යවසායකයන් සේ කටයුතු කරන අවස්ථාද දක්නට ලැබේ.

මේ සඳහා රජය වාර්ෂික අයවැයෙන් විශාල මුදලක් වෙන් කරන අතර අදාළ වෘත්තීය පුහුණුව සඳහා සුදුස්සන් යොමු කරමින් එම මුදල නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු යෙදීම ඔබ වෙත පැවරෙන විශාල වගකීමක් වනු ඇත.එලෙස වෘත්තීය පුහුණුවක් ලැබීමට හැකියාවක් නොමැති පිරිස් වෙනුවෙන්ද වෙනත් වැඩපිළිවෙළක් යෙදීම කාලීන අවශ්‍යතාවයක් බව අවබෝධ කොටගෙන ඇත.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතනවල වෘත්තීය පුහුණුවට බඳවාගනු ලබන අභ්‍යාසලාභීන් පහත සුදුසුකම් සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ.

01. වෘත්තීය පුහුණුව සඳහා තෝරාගනු ලබන්නා -

i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම.
ii. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයෙකු වීම.
iii. අවිවාහක වීම.
iv. වයස් සීමාව අවුරුදු 16 – 35 අතර වීම.

v. පුහුණු පාඨමාලාවට අදාළ වන පරිදි පහත සුදුසුකම් සපුරා තිබීම.

- ස්වාධීන බව
    - තමාගේ එදිනෙදා වැඩ තනිවම කරගැනීමේ හැකියාව
    - දෙමාපියන්ගෙන් වෙන්ව නිවසෙන් බැහැරව ජීවත්වීමට සූදානම
- පුහුණු කළ හැකි මට්ටමේ අයෙකු වීම
    - කියන දේ තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමේ හැකියාව (සවන්දීම/ග්‍රහණය කර ගැනීම/උපදෙස් පිළිපැදීම/අවධානය දීම/ධාරණය කර ගැනීම)
    - ආයතනගතව ඉගෙන ගැනීමේ අවම සූදානමකින් යුක්ත වීම

02. වෘත්තීය පුහුණුව සඳහා බඳවාගැනීම -

ග්‍රාම නිලධාරී, සමාජ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරී ( සමාජ සේවා ), පළාත් සමාජ සේවා නිලධාරී, උපකෘත පාසැල්වල විදුහල්පතිවරුන්, මඟින් වෘත්තීය පුහුණුවට බඳවාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. වෘත්තීය පුහුණුව සඳහා පුද්ගලයින් තෝරාගැනීම -

සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු හෝ නියෝජිත මණ්ඩලයක මෙහෙයවීම යටතේ කරනු ලබන ලිඛිත හෝ ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගැනීම සිදුකෙරේ.

04. වෘත්තීය පුහුණු පාඨමාලා වර්ග

එක් එක් වෘත්තීය පුහුණු ආයතනයන්හි ක්‍රියාත්මක පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු චක්‍රලේඛය අවසානයේ සඳහන් කර ඇති අතර ඔබ විසින් එම තොරතුරු අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

05. ආබාධ සහිත තත්වයන්

i. දෘෂ්‍ය ආබාධ සහිත
ii. කථන ආබාධ සහිත
iii. කායික ආබාධ සහිත
iv. බුද්ධිමය ආබාධ සහිත
v. ශ්‍රව්‍ය ආබාධ සහිත
vi. සුසුම්නා ආබාධ සහිත

## 05. වෘත්තීය පුහුණු ආයතනයන්

| අනු අංක | වෘත්තීය පුහුණු ආයතනය හා ලිපිනය | දුරකතන / ෆැක්ස් / ඊමේල් |
|---|---|---|
| 01 | සීදූව වෘත්තීය පුහුණු ආයතනය<br>ලියනගේමුල්ල, සීදූව | 0112 - 253503<br>vtcseeduwasrilanka@gmail.com |
| 02 | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය<br>අමුණුකුඹුර, වතුරුගම | 033 - 2279321<br>vtiamunukumbura@gmail.com |
| 03 | කැටවල වෘත්තීය පුහුණු ආයතනය<br>කැටවල - ලෙවල, මහනුවර | 081 – 2219153<br>katawalavti@gmail.com |
| 04 | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය<br>වාවින්න, වත්තේගම | 081 – 2476209<br>socialservices.vtiwattegama@gmail.com |
| 05 | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය<br>තෙළඹුයාය, අඟුණකොළපැළැස්ස | 047 – 3489296<br>telembuyaye@gmail.com |
| 06 | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>පුනරුත්ථාපන රෝහල, රාගම | 0112 – 958294 / 0112 – 958212<br>ragamavtc@gmail.com |
| 07 | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය<br>දේවාල පාර, පොකුවිල, මාදම්පේ | 032- 2248568<br>vtcssdoffice.madampe@gmail.com |
| 08 | විභවි වෘත්තීය පුහුණු ආයතනය<br>පහල කුකුලේගම, මීපාගම, කලවාන | 045 –2255017<br>vibhawivti@gmail.com |

## 07. දෛනික දීමනා

වෘත්තීය පුහුණුව ලබන නේවාසික හෝ නේවාසික නොවන අභ්‍යාසලාභීන් සඳහා දෛනික දීමනාව රු.150/-

මෙම දෛනික දීමනාව රජයේ ප්‍රතිපත්ති තීරණ මත වැඩි විය හැකි අතර මෙසේ ලබාදෙන මුදල වේතනයක් හෝ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීමක් ලෙස නොසැලකෙන අතර පුහුණුව ලබන කාල සීමාව තුළ දී අදාළ අයගේ මූලික අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා දෙනු ලබන හුදෙක් දීමනාවක් පමණි.

**08.** විශේෂ පහසුකම් හා අවස්ථා

i. පාඨමාලාව අවසානයේ පිළිගත් සහතිකයක් නිකුත් කිරීම
ii. පුද්ගලික අංශයේ රැකියා සඳහා මාර්ගෝපදේශනය
iii. නායකත්ව පුහුණු
iv. නොමිලේ නේවාසික පහසුකම් හා ආහාරපාන (බාහිර පුහුණුලාභීන් සඳහා ආහාරපාන සපයනු නොලැබේ)
v. නොමිලේ නිල ඇඳුම් හා දෛනික අවශ්‍යතා (රබර් සෙරෙප්පු, යට ඇඳුම්, ගැහැණු ළමුන් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය, විවේක අවස්ථාවලදී ඇඳීම සඳහා සැහැල්ලු ඇඳුම්, දත් බුරුසු, දත් බෙහෙත්,සබන්, රේසර්)
vi. පැමිණීම අනුව දෛනික දීමනාවක්
vii. මැහුම් පාඨමාලාවන් හදාරනු ලබන අභ්‍යාසලාභීන් සඳහා පුහුණුවෙන් පසු ස්වයං රැකියාවක නිරත වීමට මහන මැෂිමක් ලබාදීම
viii. පුහුණුවෙන් පසු ස්වයං රැකියාවක නිරතවන පුහුණුලාභීන් සඳහා රු. 25,000 /- ක උපකරණ කට්ටලයක්
ix. නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර
x. නවීන තාක්ෂණික මෙවලම් භාවිතය
xi. සමාජ සංවර්ධන වැඩසටහන්
xii. යෞවන කටයුතු හා ක්‍රීඩා
xiii. කලා හා සෞන්දර්යය
xiv. ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත්කිරීම
xv. අධ්‍යාපන චාරිකා / විනෝද චාරිකා හා විවිධ ප්‍රසංග

**09.** වෙනත් විශේෂිත කරුණු

01. පිළිගත හැකි හේතුවක් මත නොදන්වා පාඨමාලාවන් අතර මැද හැරයන අභ්‍යාසලාභීන් නැවත වෘත්තීය පුහුණුව සඳහා බඳවා ගනු නොලැබේ. අසනීපයක් හෝ වෙනත් පිළිගතහැකි හේතුවක් මත නියමිත පාඨමාලාවට සහභාගීවීමට නොහැකිවූ අභ්‍යාසලාභීන් සඳහා සමාජ සේවා අධ්‍යක්ෂගේ විශේෂ අනුමැතිය යටතේ පුහුණු කාලසීමාව දීර්ඝ කළ හැක.

02. වෘත්තීය පුහුණුව ලබන කාලසීමාව තුළ ආයතනයට හානිදායක වන හෝ විනය නීති කඩකරමින් හැසිරෙන අභ්‍යාසලාභීන් පිලිබඳ සමාජ සේවා අධ්‍යක්ෂගේ තීරණය මත පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

03. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතනවලින් වෘත්තීය පුහුණුව අවසන් කර පිටවන අභ්‍යාසලාභීන්ගේ පසුවිපරම් කටයුතු සිදු කිරීමට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරී, සංවර්ධන නිලධාරී (සමාජ සේවා) හා අවස්ථානුකූලව වෘත්තීය පුහුණු ආයතනභාර අධිකාරී/ ස්ථානභාර නිලධාරි මඟින් සිදු කරනු ලැබේ.

04. අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත 2020 ඔක්තෝම්බර් 15 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

05. අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් 011 2187050 යන දුරකථන අංකය මගින් තොරතුරු ලබාගත හැකිය.

චන්දන රණවීර ආරච්චි,

සමාජ සේවා අධ්‍යක්ෂ

පිටපත් -

| | |
|---|---|
| 01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 02. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරුන් | - කරු. දැ.ගැ.ස. |
| 03. අධිකාරී / ස්ථානභාර නිලධාරී | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 04. සමාජ සේවා නිලධාරී,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 05. විදුහල්පතිවරුන් - උපකෘත පාසැල් | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 06. සභාපති / අධ්‍යක්ෂ / ස්වේච්ඡා සංවිධාන | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |

## වෘත්තීය පුහුණු පාඨමාලා

| අනු අංකය | පාඨමාලාව | පාඨමාලා කාලය (අවු.) | ක්‍රියාත්මක වෘත්තීය පුහුණු ආයතන |
|---|---|---|---|
| 1 | ගුවන්විදුලි යන්ත්‍ර,රූපවාහිනී යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය - **Radio, TV and Allied Equipment Repairing** | අවු.02 | සීදූව , වත්තේගම තෙළඹියාය, රාගම |
| 2 | වඩු කාර්මික ශිල්පය - **Wood Craft** | අවු.02 | සීදූව , වත්තේගම |
| 3 | ඇඳුම් මැසීම හා ටේලරින් ශිල්පය - **Dress Making & Tailoring** | අවු.02 | සීදූව, තෙළඹියාය මාදම්පේ, රාගම |
| 4 | පරිගණක - **Computer** | අවු.02 | සීදූව, වත්තේගම |
| 5 | ත්‍රී රෝද රථ හා මෝටර් සයිකල් කාර්මික ශිල්පය **Three Wheel & Motorcycle Repair** | අවු.02 | කැටවල |
| 6 | මෝටර් රථ කාර්මික ශිල්පය - **Automobile Mechanic** | අවු.02 | තෙළඹියාය |
| 7 | ගෙවතු වගා කෘෂිකර්මික ශිල්පය **Home Garden Agriculture** | අවු.02 | තෙළඹියාය, විහවි |
| 8 | ශීතකරණ හා වායුසමීකරණ කාර්මික ශිල්පිය **Refrigeration and Air Conditioning Mechanic** | අවු.01 | සීදූව |
| 9 | මහන යන්ත්‍ර ක්‍රියාකරවීම (කර්මාන්තශාලා - ජුකි) **Industrial Sewing Machine Operating** | අවු.01 | සීදූව, මාදම්පේ |
| 10 | හස්ත කර්මාන්ත ශිල්පය (උණ/පොල් ) – **Handicraft ( Bamboo & Coconut )** | අවු.02 | විහවි |
| 11 | හස්ත කර්මාන්ත ශිල්පය (කොසු/ ඉදල්/ වේවැල්) -**Handicraft (Broom/ Eakle broom / Cane)** | අවු.01 | අමුණුකුඹුර |
| 12 | හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු) **Handicraft Ornament** | අවු.01 | අමුණුකුඹුර |
| 13 | සම්බාහන චිකිත්සාව -**Therapeutic Massage** | අවු.01 | සීදූව |
| 14 | පෙදරේරු කාර්මික ශිල්පය- **Masonry** | අවු.02 | වත්තේගම |
| 15 | මෝටර් රථ කාර්මික ශිල්පය හා යන්ත්‍ර ශිල්පය **Automobile Mechanic & Machining** | අවු.02 | කැටවල |
| 16 | විදුලි ශිල්පය - **Electrical** | අවු.02 | කැටවල, තෙළඹියාය |
| 17 | මෝටර් රථ පින්තාරු ශිල්පය - **Automobile Painting** | අවු.02 | කැටවල |
| 18 | පෑස්සුම් ශිල්පය - **Welding** | අවු.02 | කැටවල |
| 19 | සිමෙන්ති නිෂ්පාදන ශිල්පය - **Cement Product Making** | අවු.02 | අමුණුකුඹුර |
| 20 | පාවහන් හා සම් කර්මාන්ත ශිල්පය - **Footwear & Leather Craft** | අවු.01 | වත්තේගම |
| 21 | බතික් නිර්මාණ ශිල්පය හා ඇඳුම් මැසීම - **Batik & Dress Making** | අවු.01 | වත්තේගම |
| 22 | ආහාර තාක්ෂණය- **Cook** | අවු.01 | අමුණුකුඹුර |
| 23 | පේෂ කර්ම ශිල්පය - **Hand weaving** | අවු.01 | සීදූව |
| 24 | රූපලාවන්‍ය - **Beauty Culture** | අවු.01 | සීදූව |

**(සහභාගීවන සිසුන්ගේ ප්‍රමාණය අනුව පාඨමාලා හා පවත්වන ස්ථාන වෙනස් විය හැක)**

## වෘත්තීය පුහුණුවට තෝරා ගැනීමේ අයදුම් පත්‍රය
### සමාජ සේවා දෙපාර්තමේන්තුව

1. දිස්ත්‍රික්කය :- .......................................  2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ....................................

3. ග්‍රාම නිලධාරී වසම :- ..........................  4. ගෘහ මූලික අංකය :- .......................................................

5. ගෘහ මූලිකයාගේ නම :- ..........................................................................................................

6. ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය :- .....................................................

7. දුරකථන අංකය :- ....................................................

8. ආබාධ සහිත පුද්ගලයාගේ තොරතුරු

8:1 සම්පූර්ණ නම :- ......................................................................................................

8:2 ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය :- ..................................................................

8:3 ඔහුගේ/ඇයගේ උපන් දිනය :- ....................................

8:4 ඔහුගේ/ඇයගේ ස්ත්‍රී/පුරුෂ භාවය:- ............................................

8:5 ඔහුගේ/ඇයගේ ස්ථිර ලිපිනය :- ...................................................................................

8:6 ආබාධ සහිත තත්ත්වය :- ..................................................................

9. අධ්‍යාපන තොරතුරු

9:1 දැනට ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :- ......................................................................

9:2 වෙනත් හැකියාවන් හා කුසලතාවන් :- ..........................................................................

10. රුචිකත්වය දක්වන පාඨමාලා

I. ....................................................... II .......................................................

III .......................................................

11. පවුලේ විස්තර

10.1. මව/ පියා/ භාරකරු රැකියාවක් කරයි

| ඔව් | නැත |
|---|---|

10.2. ඔහුගේ /ඇයගේ රැකියාව ....................................................................................

10.3. පවුලේ සිටින සහෝදර / සහෝදරියන් ගණන (අ) සහෝදරයන් ................ (ආ) සහෝදරියන් .............

10.4. පවුලේ වෙනත් ආබාධ සහිත අය සිටීද ?

| ඔව් | නැත |
|---|---|

10.5. සිටීනම් ඒ කවුරුන්ද ?

(අ) මව / පියා ....................... ( ආ) සහෝදර / සහෝදරියන්.................... (ඇ) වෙනත්.....................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

............................................................

අයදුම්කරු /මව /පියා හෝ භාරකරුගේ අත්සන.

11. වෘත්තීය පුහුණුවට බඳවා ගැනිම නිර්දේශ කරමි.

............................................................

සමාජ සේවා නිලධාරී /සංවර්ධන නිලධාරී ( සමාජ සේවා )

( නිල මුද්‍රාව )

12. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

නිර්දේශ කරමි /නොකරමි.

............................................

දිනය: ..............................  ප්‍රාදේශීය ලේකම් ( නිල මුද්‍රාව )